මහ කොළඹ නාගරික ප්‍රවාහන සංවර්ධන ව්‍යාපෘතියේ (පිටත වටරවුම් මහාමාර්ග ව්‍යාපෘතිය) අදියර II 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. මෙම ව්‍යාපෘතිය ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය (ශ්‍රී ලං ර) සහ ජපන් ජාත්‍යන්තර සහයෝගිතා නියෝජිතායතනය (ජ ජා ස නි) අතර 2001 පෙබරවාරි 20 දින එළඹි ගිවිසුමක් යටතේ කොළඹ නගරයට පිටත වටරවුම් මාර්ගයක් ඉදිකිරීම පිළිබඳ විස්තරාත්මක සැලැසුම් අධ්‍යයනයක් කිරීම සඳහා ජපන් යෙන් මිලියන 580 කට සමාන රු. මිලියන 417 ක ප්‍රදානයක් ලැබීමෙන් මූලිකව ආරම්භ කරන ලදී. තවද 2007 මාර්තු 28 දින එවකට ජාත්‍යන්තර සහයෝගීතාව පිළිබඳ ජපන් බැංකුව (ජා ස ජ බැ) වර්තමානයේ ජපන් ජාත්‍යන්තර සහයෝගිතා නියෝජිතායතනය සහ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය (ශ්‍රීලංර) අතර කොට්ටාව සිට කඩුවෙල (අදියර 01) දක්වා කිලෝමීටර් 12 ක මහාමාර්ගය ඉදිකිරීම සඳහා අංක එස්එල්-පී 89 දරන පළමු ණය ගිවිසුමට එළඹ තිබුණි. කඩුවෙල සිට කඩවත දක්වා (අදියර II) කිලෝමීටර් 8.9 ක් වූ මහාමාර්ගය ඉදිකිරීම සඳහා 2008 ජූලි 29 දින ශ්‍රී ලංකා රජය සහ ජපන් ජාත්‍යන්තර සහයෝගිතා නියෝජිතායතනය (ජ ජා ස නි ) අතර එස්එල් - පී 91 දරන දෙවැනි ණය ගිවිසුමට එළඹ තිබූ අතර එස් එල් පී - 101 දරන තෙවැනි ණය ගිවිසුම ශ්‍රී ලංකා රජය සහ ජපන් ජාත්‍යන්තර සහයෝගිතා නියෝජිතායතනය අතර 2011 මාර්තු 22 දින එළඹෙන ලදී. 2012 අප්‍රේල් 05 දින මාර්ග සංවර්ධන අධිකාරිය විසින් කරන ලද ඉල්ලීම මත කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව විසින් නිකුත් කරන ලද 2012 අප්‍රේල් 25 දිනැති ලිපිය අනුව, වෙනම ව්‍යාපෘති කළමනාකරණ ඒකකයක් ස්ථාපිත කර තිබුණි.එබැවින් මහ කොළඹ නාගරික ප්‍රවාහන සංවර්ධන ව්‍යාපෘතියේ (පිටත වටරවුම් මහාමාර්ග ව්‍යාපෘතිය) II අදියර සඳහා 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මෙම මූල්‍ය ප්‍රකාශන වෙන්කර ඒ අනුව මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කර තිබුණි.

## 1.2 ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම, අරමුණු, මූල්‍යයනය සහ ව්‍යාපෘති කාලය

මහ කොළඹ නාගරික ප්‍රවාහන සංවර්ධන ව්‍යාපෘතියේ (පිටත වටරවුම් මහාමාර්ග ව්‍යාපෘතිය) II අදියර ණය ගිවිසුම අනුව, එවකට මහාමාර්ග, වරාය හා නාවික අමාත්‍යාංශය වර්තමානයේ මහාමාර්ග, උසස් අධ්‍යාපන හා ආයෝජන ප්‍රවර්ධන අමාත්‍යාංශය ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරවීමේ නියෝජිතායතනය වන අතර, මාර්ග සංවර්ධන අධිකාරිය (මා.සං.අ.) ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ නියෝජිතායතනය වේ. ව්‍යාපෘතියේ අරමුණ වන්නේ , කොළඹ ප්‍රධාන නගරයේ ප්‍රවාහන තදබදය අඩු කිරීමට හා රටේ අනෙකුත් ප්‍රදේශවලට සම්බන්ධතාවය වැඩිදියුණු කිරීම සඳහා දක්ෂිණ අධිවේගී මාර්ගයට සහ කොළඹ නගරයෙන් පිටතට යන අනෙකුත් ජාතික මාර්ගවලට සම්බන්ධ කෙරෙන හා කොළඹ අවට ප්‍රදේශ යාකෙරෙන අධිවේගී මාර්ගයක් ඉදිකිරීමයි. ණය ගිවිසුමට අනුව ව්‍යාපෘතියේ ඇස්තමේන්තුගත මුළු පිරිවැය රු. මිලියන 44,880 කට සමාන ජපන් යෙන් මිලියනය 36,998 ක් වන අතර, ඉන් රු. මිලියන 27,094 කට සමාන ජපන් යෙන් මිලියන 25,513 ක් මූල්‍යයනය කිරීමට ජපන් ජාත්‍යන්තර සහයෝගිතා නියෝජිතායතනය එකඟවී තිබුණි. අදියර II යටතේ මහාමාර්ගයේ ඉදිකිරීම් වැඩ ආරම්භ කිරීම 2008 මැයි මාසයට නියම වී තිබූ අතර, මාස 48 ක් ඇතුළත 2012 අප්‍රේල් වන විට නිම කිරීමට අපේක්ෂා කර තිබුණි. කෙසේ වුවද, අදියර II යටතේ මහාමාර්ගය ඉදිකිරීම් කොන්ත්‍රාත්තුව 2009 ඔක්තෝබර් 22 දින මහජන චීන සමූහාණ්ඩුවේ කොන්ත්‍රාත්කරුවකුට ප්‍රදානය කරන ලද අතර, 2015 මාර්තු වන විට නිම කිරීමට අපේක්ෂා කර තිබුණි.කොන්ත්‍රාත්තුවේ වටිනාකම රු.බිලියන 66.7 ක් විය.

## 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

මෙම මූල්‍ය ප්‍රකාශන පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම කළමනාකරණයේ වගකීම වේ. වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන අභ්‍යන්තර පාලනයන් සැලසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම සහ පවත්වාගෙන යාමත්, යෝග්‍ය ගිණුම්කරණ ප්‍රතිපත්ති තෝරා ගැනීම හා යොදා ගැනීමත් අවස්ථාවෝචිතව සාධාරණ ලෙස ගිණුම්කරණ ඇස්තමේන්තු සකස් කිරීමත් මෙම වගකීමට ඇතුළත් වේ.

## 2. විගණන විෂය පථය සහ මතය සඳහා පදනම

-----------------------------------------------------

මාගේ විගණන පරීක්ෂණ මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මෙම වාර්තාවේ ඇතුළත් විගණන මතය, අදහස් දැක්වීම් සහ සොයා ගැනීම්, විගණනය සඳහා ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන පිළිබඳ සමාලෝචනය සහ ගනුදෙනුවල නියැදි පිළිබඳ තහවුරු පරීක්ෂා කිරීම් මත පදනම් වී ඇත. එම සමාලෝචනය සහ පරීක්ෂණයන්ගේ විෂය පථය සහ ප්‍රමාණය, මට ලැබී ඇති කාර්ය මණ්ඩලය, අනෙකුත් සම්පත් සහ කාලවේලා යන සීමාවන් ඇතුළත හැකිතාක් පුළුල් විගණනයක් කළ හැකි වන පරිදි පිළියෙල කරන ලද්දකි. මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබා ගැනීම පිණිස ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට උපකාරී වන සාක්ෂි නියැදි පදනම මත පරීක්ෂා කිරීම්, මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී කළමනාකරණය විසින් අනුගමනය කරන කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්ති හා වැදගත් ඇස්තමේන්තු සහ මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීම ද විගණනයට ඇතුළත් වේ. මාගේ උපරිම දැනීම සහ විශ්වාසය පරිදි විගණන කටයුතු සඳහා අවශ්‍ය වන ප්‍රමාණවත් තොරතුරු සහ පැහැදිලි කිරීම් මා විසින් ලබා ගන්නා ලදී. ඒ අනුව මාගේ මතය සඳහා ප්‍රමාණවත් පදනමක් මාගේ විගණනය මඟින් සපයන බව මාගේ විශ්වාසයයි. පහත සඳහන් දෑ තක්සේරු කිරීමෙහිලා අවශ්‍ය යැයි සලකනු ලැබූ පද්ධති හා පාලන, ගනුදෙනු, වත්කම්, වගකීම් හා ගිණුම් වාර්තා පිළිබඳ එවැනි පරීක්ෂාකිරීම්ද එම පරීක්ෂණයට ඇතුළත් විය.

(අ) අභ්‍යන්තර පාලන අංශයෙන් බලන කල ව්‍යාපෘති කළමනාකරණය පිළිබඳ සතුටුදායක පාලනයක් සහ ව්‍යාපෘතියේ මෙහෙයුම්වලට අදාළ පොත්පත්, වාර්තා ආදියෙහි විශ්වාසවන්තභාවය තහවුරු වනු පිණිස පද්ධති හා පාලන ප්‍රමාණවත් වූයේද යන බව.

(ආ) ශ්‍රී ලංකා රජයෙන් සහ ණය සපයනු ලබන නියෝජිතායතනයෙන් ලද අරමුදල්වලින් දරන ලද ව්‍යාපෘති වියදම, මූල්‍ය සහ භෞතික වශයෙන් ව්‍යාපෘතියේ ප්‍රගතිය, ව්‍යාපෘතියේ මෙහෙයුම්වලින් උද්ගත වූ වත්කම් හා වගකීම්, ණය යටතේ කරන ලද මිලදී ගැනීම් හඳුනා ගැනීම ආදිය දැක්වෙන පරිදි අඛණ්ඩ පදනමක් මත ප්‍රමාණවත් ගිණුම් වාර්තා පවත්වා ගනු ලැබුවේ ද යන බව.

(ඇ) ණය යටතේ ආපසු ගැනීම් ණය ගිවිසුම්වල නියම කරන ලද පිරිවිතරයන්ට අනුකූලව සිදුකර තිබුණේද යන බව.

(ඈ) ණය යටතේ සපයන ලද අරමුදල්, ද්‍රව්‍ය හා උපකරණ ව්‍යාපෘතියේ අරමුණු සඳහා උපයෝජනය කර තිබුණේද යන බව.

(ඉ) ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා යොදාගන්නා ලද වර්ගීකරණයට අනුව වියදම් නිවැරදි ලෙස හඳුනාගෙන තිබුණේද යන බව.

(ඊ) පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්ම පදනම් කරගෙන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර තිබුණේද යන බව.

(උ) මාගේ පෙර වර්ෂයේ විගණන වාර්තාවෙන් පෙන්වා දෙන ලද කරුණු නිවැරදි කර ගැනීමට කළමනාකරණය විසින් සතුටුදායක පියවර ගෙන තිබුණේද යන බව සහ

(ඌ) ණය ගිවිසුම්වල දක්වා ඇති මූල්‍ය සම්මුතීන්වලට අනුකූලව කටයුතු කර තිබුණේද යන බව.

## 3. මතය

මාගේ පරීක්ෂණයෙන් පෙනී යන අන්දමට සහ මට සපයන ලද උපරිම තොරතුරු සහ පැහැදිලි කිරීම් අනුව සහ මෙම වාර්තාවේ 5 ඡේදයේ දැක්වෙන කරුණුවලින් උද්ගත වන ගැලපීම්වලින් ඇතිවන බලපෑම් හැරුණු විට මා දරන්නා වූ මතය වනුයේ,

(අ) 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ව්‍යාපෘතිය නිසි ගිණුම් වාර්තා පවත්වා ඇති බව සහ 2013 දෙසැම්බර් 31 දිනට ව්‍යාපෘතියේ ක්‍රියාකාරීත්වය පිළිබඳ තත්ත්වය සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව,

(ආ) සපයන ලද අරමුදල් ඒවා සපයනු ලැබූ අරමුණු සඳහා උපයෝජනය කර තිබුණු බව සහ

(ඇ) ණය ගිවිසුම්වල දක්වා ඇති මූල්‍ය සම්මුතීන්වලට අනුකූලව කටයුතු කර තිබුණු බවත්ය.

## 4. මූල්‍ය ප්‍රකාශන

### 4.1 මූල්‍ය කාර්යසාධනය

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන සහ ලබාගත හැකි වූ තොරතුරු අනුව, 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ව්‍යාපෘති වියදම රු. 18,793,257,546 ක් වූ අතර, 2013 දෙසැම්බර් 31 දිනට සමුච්චිත වියදම රු. 24,834,824,577 ක් විය. සමාලෝචිත වර්ෂය සඳහා වියදම, ඉකුත් වර්ෂය සඳහා වියදම සහ 2013 දෙසැම්බර් 31 දිනට සමුච්චිත වියදම පිළිබඳ සාරාංශයක් පහත ප්‍රකාශයෙන් දැක්වේ.

| **විස්තරය** | **දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා දරන ලද වියදම** | | **2013 දෙසැම්බර් 31 දිනට සමුච්චිත වියදම** |
|---|---|---|---|
| | **2013** | **2012** | |
| | රු. | රු. | රු. |
| දේපල, පිරියත හා උපකරණ | 579,277 | 1,583,655 | 3,242,066 |
| ඉඩම් සහ ඉඩම් වැඩිදියුණු කිරීම් | 144,879,973 | 820,137,996 | 1,661,691,368 |
| ව්‍යාපෘති කළමනාකරණ වියදම් | 54,403,206 | 96,630,020 | 160,036,875 |
| ඉදිකිරීම් පිරිවැය | 18,238,660,551 | 4,123,658,531 | 22,372,272,209 |
| උපදේශක සේවා | 354,734,539 | 282.847,520 | 637,582,059 |
| එකතුව | 18,793,257,546 | 5,324,857,722 | 24,834,824,577 |

## 5. විගණන නිරීක්ෂණ

### 5.1. ගිණුම්කරණ අඩුපාඩු

අවස්ථා කිහිපයකදී මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ දැක්වෙන මුදල් ප්‍රමාණයන් අනුරූපී ලියකියවිලි සමඟ එකඟ වී නොතිබුණි. විගණනය විසින් පෙන්වා දීමෙන් පසු එම වෙනස්කම් ව්‍යාපෘතිය විසින් හඳුනා ගන්නා ලදි.කෙසේ වුවද මූල්‍ය ප්‍රකාශන ඒ අනුව නිවැරදි කර නොතිබුණි. විගණනයේදී නිරීක්ෂණය වූ අවස්ථා පිළිබඳ විස්තර පහත දැක්වේ.

(අ) රැස් කරගත් තොරතුරු අනුව, නැවත පදිංචි කිරීම සඳහා ඉඩම් අත්පත් කරගැනීමේ කටයුතු වෙනුවෙන් ගෙවන ලද වන්දි මුදල් රු.1,516,444,923 ක් විය.කෙසේවුවද එය මූල්‍ය ප්‍රකාශනවල රු.1,516,811,395 ක් ලෙස දැක්වීම හේතුවෙන් රු.366,472 ක වෙනසක් දැක්වුණි.

(ආ) මූල්‍ය ප්‍රකාශන අනුව, කෙරී ගෙන යන සිවිල් වැඩ සඳහා රු.18,792,678,370 ක මුදලක් වැයකර තිබුණි.කෙසේ වුවද, ආයෝජන කටයුතුවලින් මුදල් ප්‍රවාහය ගණනය කිරීමේදී දෝෂයක් හේතුවෙන් මුදල් ප්‍රවාහයේ දැක්වෙන අනුරූපී සංඛ්‍යාව රු.24,115,952,439 ක් විය.

(ඇ) සමාලෝචිත වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය අනුව, අත්තිකාරම් හා පූර්ව ගෙවීම් මුදල් ගලායාම් රු.3,635,400 ක් විය. කෙසේ වුවද මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය අනුව එය රු.3,638,400 ක් ලෙස දැක්වුණි.

(ඈ) මුදල් ප්‍රවාහ ප්‍රකාශනය අනුව, සමාලෝචිත වර්ෂය තුළ වියපැහැදම් කළ අරමුදල් රු.11,012,776,383 ක් ලෙස දක්වා තිබුණි.කෙසේ වුවද මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ දැක්වෙන අනුරූපී සංඛ්‍යාව රු.10,740,594,665 ක් විය.

(ඉ) 2013 දෙසැම්බර් 31 දිනට දේශීය උපදේශකවරුන්ට ගෙවිය යුතු රු.14,577,343 ක මුදල දෙවරක් ගිණුම් ගත කර තිබුණි.

(ඊ) අතුරු ගෙවීම් සහතික අනුව, 2013 දෙසැම්බර් 31 දිනට එකතුව රු.1,822,010,292 ක්වූ වැඩ පූර්ව අත්තිකාරම් අය කරගෙන තිබුණි. කෙසේවුවද, මූල්‍ය ප්‍රකාශන අනුව එය රු.3,635,672,999 ක් ලෙස දක්වා තිබුණි.

## 5.2 නොසැඳු පාලන ගිණුම්

ස්ථාවර වත්කම් ලේඛනය යාවත්කාලීන කර නොතිබුණි.එහි ප්‍රතිඵලයක් ලෙස සමාලෝචිත වර්ෂය තුළ පිරිවැය රු.1,918,542 කට ප්‍රසම්පාදනය කරන ලද වත්කම් ස්ථාවර වත්කම් ලේඛනයේ ඇතුළත් කර නොතිබුණි.

## 6. මූල්‍ය හා මෙහෙයුම් සමාලෝචනය

## 6.1 අරමුදල් උපයෝජනය

මූල්‍ය ප්‍රකාශන සහ ලබා ගත හැකි වූ තොරතුරු අනුව, ව්‍යාපෘති මූල්‍යයනය සහ සමාලෝචිත වර්ෂය අවසානයට අරමුදල් උපයෝජනය පිළිබඳ වැදගත් සංඛ්‍යා ලේඛන කීහිපයක් පහත දැක්වේ.

| ප්‍රභවය | ණය ගිවිසුම් අනුව මූල්‍යයනය සඳහා එකඟවූ මුදල | | 2013 වර්ෂය සඳහා අයවැය ගත ප්‍රතිපාදනය | 2013 වර්ෂය තුළ උපයෝජනය කළ අරමුදල් | 2013 දෙසැම්බර් 31 දක්වා උපයෝජනය කළ අරමුදල් | |
|---|---|---|---|---|---|---|
| | ජපන් යෙන් මිලියන | රු. මිලියන | රු. මිලියන | රු. මිලියන | ජපන් යෙන් මිලියන | රු. මිලියන |
| ජපන් ජාත්‍යන්තර සහයෝගීතා නියෝජිතායතනය | | | | | | |
| ණය අංක පී-91 | 25,513 | 27,094 | 10,256 | 10,255 | 7,798 | 22,488 |
| ශ්‍රීලංර | 11,485 | 17,786 | 389 | 389 | 503 | 1,161 |
| | 36,998 | 44,880 | 10,645 | *10,644 | 8,301 | 23,649 |

* ගෙවිය යුතු මුදල් ඇතුළත් නොකිරීම හේතුකොටගෙන මෙම මුදල, මෙම වාර්තාවේ 4.1 ඡේදයේ දැක්වෙන මුදල සමඟ එකඟ නොවේ.

6.2 භෞතික කාර්යසාධනය

6.2.1 අධිවේගී මාර්ගයේ අදියර II හි භෞතික කාර්යසාධනය

(අ) 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ව්‍යාපෘතියේ ප්‍රගති වාර්තාව අනුව, ඉටුකර ගන්නා ලද තථ්‍ය ප්‍රගතිය සියයට 44 ක් වූ අතර එයට ප්‍රතිරූපිව සංශෝධිත ඉලක්කය සියයට 68 ක් වූයෙන් තථ්‍ය ප්‍රගතිය ඉලක්කයට වඩා පිටුපසින් පැවතුණි. මහාමාර්ග, උසස් අධ්‍යාපන හා ආයෝජන ප්‍රවර්ධන අමාත්‍යාංශයේ ලේකම්ගේ පැහැදිලි කිරීමට අනුව, කැළණි ගඟ උඩින් පාලම ඉදිකිරීම, පාෂාණ පැතිකඩ (rock profile) මත අනපේක්ෂිත විචලනයන්, ෆයිල් කැප්ස් (file caps) නැවත සැලසුම් කිරීම මත වූ ප්‍රමාදයන් සහ තාවකාලික පාලම් ආදිය සඳහා වාරිමාර්ග **දෙපාර්තමේන්තුවෙන් අනුමැතිය ලැබීමේ ප්‍රමාදයන් මෙම අඩු කාර්ය සාධනයට හේතු වී තිබුණි.**

**6.2.2 කොන්ත්‍රාත් පරිපාලනය**

පහත නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) කඩුවෙල සිට කඩවත දක්වා (කිමී8) (අදියර II) මාර්ග කොටස ඉදිකිරීම සම්බන්ධයෙන් කොන්ත්‍රාත්කරු විසින් ඉදිරිපත් කරන ලද රු.බිලියන 62.041 ක් වූ ලංසු වටිනාකම රු.බිලියන 31.334 ක් වූ ඉංජිනේරු ඇස්තමේන්තුව ඉක්මවා තිබූ හෙයින් කොන්ත්‍රාතුව පිරිනැමීම අවලංගු කිරීමට 2010 ඔක්තෝබර් 06 දින අමාත්‍ය මණ්ඩලය විසින් තීරණය කර තිබුණි. කෙසේ වුවද, අමාත්‍ය මණ්ඩල තීරණයට පටහැනිව, ඉහත ලංසුව නැවත සලකා බලා, ලංසු මිල රු.බිලියන 44.88 දක්වා අඩු කිරීමෙන් පසුව 2011 නොවැම්බර් 25 දින පිරිනමා තිබුණි. ලැබුණු තොරතුරු අනුව, ඉංජිනේරු ඇස්තමේන්තුව හෝ දෙවැනි ලංසුව සඳහා රේටයන් අධීක්ෂණ උපදේශක හා තාක්ෂණ ඇගයීම් කමිටුව විසින් අනුමත කර නොතිබුණද 2011 නොවැම්බර් 25 දින පැවති අමාත්‍ය මණ්ඩල රැස්වීමේදී දෙවැනි ලංසුව සඳහා අනුමැතිය ලබා දී තිබුණි.

(ආ) ඉංජිනේරු ඇස්තමේන්තුව අනුව, මෝටර් වාහන 15 ක් හා යතුරුපැදි 8 ක් මූලික වියදම් වර්ගය යටතේ ප්‍රසම්පාදනය කිරීම සඳහා එකතුව රු.120,728,000 ක්වූ මුදල් වෙන්කිරීම් කර තිබුණි. කෙසේ වුවද මෝටර් වාහන 21 ක් හා යතුරුපැදි 12 ක් ප්‍රසම්පාදනය කිරීමට තාවකාලික මුදල් සඳහා වෙනත් වර්ගය යටතේ රු.මිලියන 153.54 ක් දක්වා මෙම වෙන්කිරීම වැඩිකර තිබුණි. කෙසේ වුවද රු. මිලියන 185.62 ක්වූ තථ්‍ය පිරිවැය රු. මිලියන 32 කින් වෙන්කිරීම ඉක්මවා තිබුණි.

(ඇ) කොන්ත්‍රාත්කරු විසින් දරන ලද රු.19,884,107 ක් වූ එකතු කළ අගය මත බදු ව්‍යාපෘතිය විසින් ලැබුණු ණය මුදල්වලින් ප්‍රතිපූර්ණය කර තිබුණි. තවද ප්‍රතිපූර්ණය කිරීමේ ප්‍රමාදය මත පොලියක් ලෙස රු.6,900,740 ක මුදලක්ද කොන්ත්‍රාත්කරු විසින් ඉල්ලා තිබුණි.

(ඈ) අතිරේක පාංශු නියැදි පරීක්ෂණය සඳහා මූලික ප්‍රමාණ පත්‍රයේ ප්‍රතිපාදනය රු.මිලියන 3.3 ක් වුවද, මෙම කාර්යය සඳහා මූලික ප්‍රතිපාදනය රු.මිලියන 50.49 කින් ඉක්මවා රු.මිලියන 53.79 ක් කොන්ත්‍රාත්කරුට ගෙවා තිබුණි.

(ඉ) අතුරු ගෙවීම්, සහතික අංක 30 අනුව, තාවකාලික මුදල් යටතේ ප්‍රමාණපත්‍ර වල ඇතුළත් නොවූ "සොනික් ලොගින් ටෙස්ට්" ( sonic logging test ) සඳහා අත්‍යවශ්‍ය "සොනික් ලොගින් ටෙස්ට්" (sonic logging test ) උපාංග හා ගුවුටින් ද්‍රව්‍ය සැපයීම හා පොම්ප කිරීම සඳහා ප්‍රතිඵලයක් ලෙස මිමී 50 විෂ්කම්භයේ ජී අයි පයිප්ප සැපයීම හා සවිකිරීම සඳහා තාවකාලික වර්ගය යටතේ කොන්ත්‍රාත්කරුට රු.159,173,175 ක මුදලක් ගෙවා තිබුණි.

(ඊ) තවද ඉංජිනේරු ඇස්තමේන්තුවල විෂයය හඳුනා ගැනීමකින් තොරව හෝ කොන්ත්‍රාත්තුවේ ප්‍රමාණපත්‍ර අනුමත කිරීමකින් තොරව සියයට 182 කින් ප්‍රමාණපත්‍ර වටිනාකම ඉක්මවමින් තාවකාලික මුදල් වර්ගය යටතේ ෆයිල් ඉන්ටිග්‍රිටි සඳහා "සොනික් ලොගින් ටෙස්ට්" (sonic logging test) වෙනුවෙන් රු.මිලියන 138.28 ක මුදලක් කොන්ත්‍රාත්කරුට ගෙවා තිබුණි.

(උ) කොන්ත්‍රාත් කොන්දේසි 60.2 වගන්තිය අනුව, රු.මිලියන 200 ක වටිනාකමක් ඉක්මවූ අතුරු ගෙවීම් සහතික ඇගයීම් කිරීම සඳහා සැලකිල්ලට ගත යුතුය. කෙසේ වුවද රු මිලියන 143.5 ක් හා රු.මිලියන 136.4 ක් වටිනා අතුරු ගෙවීම් සහතික 2 ක් ඇගයීම් කාර්යය සඳහා ගෙන තිබුණි.

(උ) කොන්ත්‍රාත් කොන්දේසි 60.5 වගන්තිය අනුව, අතුරු ගෙවීම් සහතිකවලින් සියයට 10 ක රඳවා ගැනීම් මුදල් අඩුකළ යුතුය. කෙසේ වුවද අතුරු ගෙවීම් සහතික - 20 න් සියයට 5 ක රඳවා ගැනීම් මුදල් අඩුකර තිබූ අතර එහි ප්‍රතිඵලයක් ලෙස රු.මිලියන 464.7 ක් කොන්ත්‍රාත්කරුට වැඩිපුර ගෙවා තිබුණි.

6.2.3 උපදේශක කොන්ත්‍රාත්

---------------------------

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) උපදේශක සේවා සඳහා අතිරේක ගිවිසුම අනුව, නේවාසික ඉංජිනේරු, විදුලි ඉංජිනේරු හා සැලසුම් ඉංජිනේරු ව්‍යාපෘති කාර්යයන් ක්‍රියාත්මක කිරීම සඳහා බඳවා ගත යුතුය. කෙසේ වුවද 2014 ජුලි දක්වා එම තනතුරු පුරප්පාඩුව පැවතුණි.

(ආ) තවද, මූලික උපදේශක සේවා ගිවිසුම යටතේ බඳවා ගැනීමට අවශ්‍ය වූ ඉංජිනේරුවන් 04 දෙනෙකු 2014 ජුලි දක්වා බඳවා ගෙන නොතිබුණි.

(ඇ) ඉදිකිරීම් කොන්ත්‍රාත් පිරිවිතර අංක 102 අනුව, ව්‍යාපෘති කටයුතු ආරම්භයේදීම උපදේශක ඉංජිනේරුවරයා සඳහා කාර්යාලය සහ නේවාසික පහසුකම් සැපයීම සඳහා රු.මිලියන

287.01 ක මුදලක් කොන්ත්‍රාත්කරුට වෙන්කර තිබු අතර, 2013 ජුනි දක්වා ඒ සඳහා රු.මිලියන 163.30 ක් ගෙවා තිබුණි. කෙසේ වුවද ව්‍යාපෘති කටයුතු ආරම්භ වීමෙන් වර්ෂ 1 ½ කට පසුව නේවාසික පහසුකම් ලබා දී තිබුණි. කොන්ත්‍රාත් කොන්දේසි අංක 49.4 අනුව, නේවාසික පහසුකම් නොසැපයූ මාසවලට අදාළ මුදල අඩුකර ගැනීම අවශ්‍ය වුවද, සම්පූර්ණ කාල පරිච්ඡේදය සඳහාම වූ රු.මිලියන 71.16 ක මුදල කොන්ත්‍රාත්කරුට ගෙවා තිබුණි.

(ඇ) උපදේශකවරුන් 13 දෙනෙකුට නේවාසික පහසුකම් සැපයීම සඳහා පහසුකම් තිබුණද, උපදේශකවරුන් 07 දෙනෙකුට පමණක් එම පහසුකම් ලබා දී තිබුණි. 2013 ජුනි මස සිට අනෙක් උපදේශකවරුන් 06 දෙනෙකුට රු.13,000 බැගින් මාසික දීමනාවක් එක් එක් උපදේශකවරයාට ගෙවා තිබුණි.

6.2.4 මතභේදයට තුඩුදෙන කරුණු

---------------------------------

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) ණය ගිවිසුම් අනුව, ණය බල පැවැත්වීමේ දිනය 2009 මාර්තු මාසය විය. කෙසේ වුවද 2012 ජනවාරි මස සිට ණය මුදල් වියපැහැදම් කර තිබුණි. එහි ප්‍රතිඵලයක් ලෙස ව්‍යාපෘතිය විසින් ණය සපයන නියෝජිතායතනයට රු.29,402,050 ක්වූ බැඳීම් ගාස්තු ගෙවා තිබුණි.

(ආ) රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවේ 2003 ජුනි 02 දිනැති අංක පීඊඩී/12 දරන චක්‍රලේඛයේ 8.3.9 සහ 8.6 වගන්තිවලට පටහැනිව ව්‍යාපෘතියට අනුයුක්ත මාර්ග සංවර්ධන අධිකාරියේ සේවකයන්ට රු.1,478,514 ක්වූ නිවාඩු මුදල් කරගැනීමේ දීමනා, රු.424,737 ක් වූ වෛද්‍ය රක්ෂණ දීමනා, සහ රු.3,501,406 ක් වූ දීමනා ගෙවා තිබුණි.

(ඇ) ව්‍යාපෘතියේ අරමුණු සඳහා ඍජුවම අදාළ නොවන කාර්යයන් සඳහා ව්‍යාපෘතිය විසින් රු.මිලියන 21.2 ක මුදලක් වැයකර තිබුණි. තවද එම ගෙවීම් අදාළ අනුමැතීන් ලබාගැනීමෙන් තොරව ඉදිකිරීම් වැඩවල විචලනයන් ලෙස සිදුකර තිබුණි.

(ඈ) කළමනාකරණ සේවා දෙපාර්තුමේන්තුවේ අනුමැතිය ලබා ගැනීමෙන් තොරව ව්‍යාපෘතිය විසින් උපදේශකවරුන් 4 දෙනෙකු සේවයේ යොදවා තිබුණි. තවද, ඔවුන්ට සමාලෝචිත වර්ෂය තුළ එකතුව රු.මිලියන 6.84 ක පාරිශ්‍රමික ගෙවා තිබූ නමුත් යොමුගත කොන්දේසි නිකුත්කර නොතිබුණි.

6.2.5 ඉඩම් අත්පත් කරගැනීම හා නැවත පදිංචි කිරීමේ කටයුතු

-----------------------------------------------------------------

මූල්‍ය ප්‍රකාශන අනුව, ව්‍යාපෘති කාර්යයන් හේතුවෙන් අවතැන් වූ පුද්ගලයන් නැවත පදිංචි කිරීම සඳහා හෙක්ටයාර් 1.3286 ක ඉඩම් ප්‍රමාණයක් අත් කරගැනීමට 2013 දෙසැම්බර් 31 දක්වා රු.මිලියන 1,661.7 ක මුදලක් ව්‍යාපෘතිය විසින් වැයකර තිබුණි.තවද, ව්‍යාපෘතියේ ඉඩම් අත්පත් කරගැනීමේ හා නැවත පදිංචි කිරීමේ කටයුතු 2013 දෙසැම්බර් 31 දින වනවිට නිම කිරීමට අපේක්ෂා කර තිබුණි. මහාමාර්ග අදියර II යටතේ ඉඩම් අත්පත් කරගැනීමේ කටයුතු සියයට 94 ක් සම්පූර්ණ කර තිබුණද 2013 දෙසැම්බර් 31 දිනට නැවත පදිංචි කිරීමේ කටයුතු සියයට 70 ක් පමණක් සම්පූර්ණ කර තිබුණි.

6.2.6 මානව සම්පත් කළමනාකරණය

-------------------------------------

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) 2007 අප්‍රේල් 05 දිනැති අංක 33 දරන කළමනාකරණ දෙපාර්තමේන්තු චක්‍රලේඛයේ අංක 2.2.4 හා 2.2.7 ඡේද අනුව ජාතික පුවත්පත් මඟින් ඉල්ලුම්පත් කැඳවා කාර්ය මණ්ඩලය බඳවා ගැනීම් සිදු කළ යුතු අතර වර්ෂ තුනකට වැඩිනොවන කාලයක් සඳහා කොන්ත්‍රාත් පදනම මත

පත්වීම් ලබාදිය යුතුය. කෙසේ වුවද මාර්ග සංවර්ධන අධිකාරියෙන් මුදාහරින ලද නිලධාරින් ඇතුළු ව්‍යාපෘතියේ සියලුම කාර්ය මණ්ඩලය, ඉහත චක්‍රලේඛයේ විධිවිධාන වලට පටහැනිව තාවකාලික පදනම මත බඳවා ගෙන තිබුණි.

(ආ) කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව විසින් ව්‍යාපෘතිය සඳහා 35 ක කාර්ය මණ්ඩලයක් අනුමත කර තිබුණද, ව්‍යාපෘතිය විසින් 24 දෙනෙකු පමණක් බඳවාගෙන තිබුණු අතර සමාලෝචිත වර්ෂය තුළ තනතුරු 11 ක් පුරප්පාඩු වී පැවතුණි.

6.2.7 මෝටර් වාහන උපයෝජනය

---------------------------------

ව්‍යාපෘතියේ මොටර් වාහන සංචිතය කුලියට ගත් මෝටර් වාහන 03 කින් හා කොන්ත්‍රාත්කරු විසින් සපයා තිබුණු මෝටර් වාහන 05 කින් සමන්විත විය. 2007 දෙසැම්බර් 20 දිනැති අංක 33(1) දරන කළමනාකරණ සේවා දෙපාර්තමේන්තු චක්‍රලේඛය ප්‍රකාරව, වාහන පහසුකම් හිමිකම් නොමැති නිලධාරින්ට මෝටර් වාහන 06 ක් වෙන් කර තිබූ බව නිරීක්ෂණය විය.